# PAFFREL

නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය.

சுதந்திரமானதும் நியாயமானதுமான தேர்தல்களுக்கான மக்கள் செயற்பாடு.

PEOPLE'S ACTION FOR FREE & FAIR ELECTIONS


දිනය -2020 ජූලි 26

**<u>මාධ්‍ය නිවේදනය</u>**

**දේශපාලන පක්‍ෂ ස්වාධීන කණ්ඩායම් හෝ අපේෂකයන් <u>ප්‍රවර්ධනය කිරීමේ ක්‍රියාවන්ට දායක නොවන ලෙස මාණ්ඩලික සහ අධීක්‍ෂණ නිලධාරීන්ගෙන් කරනු ලබන ඉල්ලීමයි</u>**

මාණ්ඩලික සහ අධීක්‍ෂණ ශ්‍රේණියේ ඇතැම් රාජ්‍ය නිලධාරීන් දේශපාලන පක්‍ෂ සහ අපේක්‍ෂකයින් ප්‍රවර්ධන කටයුතුවලට ඍජුවම සහ වක්‍රව සම්බන්ධ වන බවට අප වෙත තොරතුරු ලැබෙමින් පවතී. ඡන්ද මධ්‍යස්ථානවල සහ ඡන්දය ගණන් කිරීමේ මධ්‍යස්ථාවල තීරණාත්මක කාර්යයභාරයක් ඉටුකරන රාජ්‍ය සේවයේ ඉහල තනතුරු දරණ මෙම නිලධාරීන් දේශපාලන ප්‍රවර්ධන කටයුතුවලට සම්බන්ධ වීම නිදහස් සහ සාධාරණ මැතිවරණයක් සඳහා වන බාධාවක් බව අපගේ අවබෝධයයි.

මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද නියෝග අනුවද ආයතන සංග්‍රහය අනුවද මාණ්ඩලික ශ්‍රේණියේ සහ අධීක්‍ෂණ ශ්‍රේණියේ නිළධාරින්ට මැතිවරණයේදී ඡන්දය භාවිතා කිරීම හැර වෙනත් කිසිදු ආකාරයක දේශපාලන ක්‍රියාවක නිරත වීම තහනම් කර තිබේන බව සිහිපත් කරමු.

එමෙන්ම මාණ්ඩලික නිලධාරීන් ලෙස ඔබ දේශපාලන පක්‍ෂපාතීත්වයෙන් තොරව කටයුතු කරනු ලැබුවහොත් සියලු පාර්ශවයන්ගේ ගෞරවය ඔබට හිමිවනු ඇත. එමෙන්ම ඔබගේ සහයකින් තොරව දේශපාලනඥයන්ට රාජ්‍ය බලය හෝ දේපළ අවභාවිතා කිරීමට නොහැකි බවද අවධාරණය කරමු.

දේශපාලන ප්‍රවර්ධන කටයුතුවලින් වැළකී පාලනය කරන ලද කොවිඩ්-19 වසංගත තත්වයක් තුල ඉතාමත් අභියෝගාත්මකව පවත්වන මෙම මැතිවරණයේ නිදහස් සහ සාධාරණ බව ආරක්‍ෂා කිරීම සඳහා දායකවන ලෙස රාජ්‍ය සේවයේ මාණ්ඩලික සහ අධීක්‍ෂණ නිලධාරීන්ගේ පැෆ්රල් සංවිධානය ඉල්ලා සිටියි.



රෝහණ හෙට්ටිආරච්චි

විධායක අධ්‍යක්‍ෂක




# No.16, Byrde Place, Off Pamankada Rd, Colombo 06, Sri Lanka.

Tel: (+94) 11 2 558 570 / 11 2 558 571    Fax: (+94) 11 2 558 572

E-Mail: paffrel@sltnet.lk    Website: www.paffrel.lk